## "රටක් වටින පොතක් " පොත් 10,000ක් ලිවීමේ ව්‍යාපෘතිය - ඔබේ පැනයට පිළිතුරු

01. **ප්‍රශ්නය -** පොත් නිර්මාණය සඳහා භාවිත කරන අකුරු ප්‍රමාණය

**පිළිතුර -** ළමා කතන්දර පොත් සඳහා - **14/16/18**
ළමා නොවන වෙනත් පර්යේෂණ, ශාස්ත්‍රීය, නිර්මාණාත්මක සාහිත්‍යය කෘති සඳහා - **12**

02. **ප්‍රශ්නය -** එක් එක් පොත් අවසන් මුද්‍රණය කිරීමේදී පිටුවෙහි ප්‍රමාණය කොපමණද?

**පිළිතුර -** ළමා කතන්දර පොත් සඳහා **- A4**
ළමා නොවන වෙනත් කෘති සඳහා **- A5**

03. **ප්‍රශ්නය -** එක් එක් නිර්මාණය සඳහා අවශ්‍ය අවම පිටු ප්‍රමාණය කොපමණද?

**පිළිතුර -** ළමා කතන්දර පොත් සඳහා අවම - **පිටු 16 (පිටකවරය හැර), චිත්‍ර 05ක් සමග**
ළමා නොවන වෙනත් සියලු නිර්මාණ සඳහා අවම - **පිටු 49 (පිටකවරය හැර)**

04. **ප්‍රශ්නය -** නිර්මාණ පරිගණකගත කිරීමේදී පේළි අතර ප්‍රමාණය කොපමණද?

**පිළිතුර -** ළමා කතන්දර පොත් සඳහා පේළි අතර පරතරය - **1.5**
ළමා නොවන වෙනත් නිර්මාණ සඳහා පේළි අතර පරතරය - **Single Space**

05. **ප්‍රශ්නය -** එක් එක් කෘතිවල මුල් පිටු සකස් කරන්නේ කෙසේද?

**පිළිතුර -** ළමා කතන්දර පොත් සඳහා - ග්‍රන්ථ නාම පිටුව, ග්‍රන්ථ නාම පිටුවේ පසු පිටුව හා පිදුම ප්‍රමාණවත්ය.

උදා :-




(ආදර්ශ පිටපතකි)
ග්‍රන්ථ නාම පිටුව




(ආදර්ශ පිටපතකි)
ග්‍රන්ථ නාම පිටුවේ පසු පිටුව

- ළමා නොවන වෙනත් කෘති සඳහා - අර්ධ ග්‍රන්ථ නාම පිටුව, අර්ධ ග්‍රන්ථ නාම පිටුවේ පසු පිටුව, ග්‍රන්ථ නාම පිටුව, ග්‍රන්ථ නාම පිටුවේ පසු පිටුව, පිදුම, ස්තූතිය, පෙරවදන හා පටුන පිළිවෙළින් යෙදිය යුතුය. මේ සඳහා වැඩි විස්තර ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ නිවහන් පිටුවේ ඇති "ග්‍රන්ථ සැකැස්මේ ක්‍රමවේදය" හා "ළමා ග්‍රන්ථ සැකැස්මේ ක්‍රමවේදය" නියමු ග්‍රන්ථ අධ්‍යයනය කිරීම සුදුසුය. (www.natlib.lk)

06. **ප්‍රශ්නය -** කෘති පරිගණක ගත කිරීමේ අකුරු වර්ගය ?

**පිළිතුර -** ඉදිරිපත් කරනු ලබන අත්පිටපත පරිගණක ගත කර ඉදිරිපත් කළ යුතුය. (පරිගණක ගත පිටපතක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් නොමැතිනම් පමණක් අතින් ලියන ලද පිටපත ඉදිරිපත් කළ හැක). පරිගණක යතුරු ලියනය කිරීමේදී යුනිකෝඩ් (Iskoola Pota- Sinhala / Latha- Tamil) විය යුතුය. යම් හෙයකින් ඔබට යුනිකෝඩ් ෆොන්ට් භාවිත කළ නොහැකි නම් FMAbhaya, Times New Romen, FM Bamini භාවිත කළ හැක.

07. **ප්‍රශ්නය -** පොත් භාර දෙන අවසාන දිනය කවදාද?

**පිළිතුර -** සියලුම නිර්මාණ 2020 ජූලි මස 30වනදාට පෙර දරුවාගේ පාසලට භාර දිය යුතුය.

08. **ප්‍රශ්නය -** නිර්මාණ භාර දිය යුත්තේ කෙසේද?

**පිළිතුර -** නිවැරදිව සකස් කරන ලද පරිගණක ගත කරන ලද නිර්මාණ එම පරිගණක ගත කරන ලද පිටපත, එහි PDF කළ මෘදු පිටපත ඇතුළත් CD තැටිය සමග නිර්මාණ භාර ගන්නා අවසාන දින හෝ එදිනට පෙර දරුවාගේ පාසලට භාර දිය යුතුය.

මේ වැඩිදුර සවිස්තරාත්මක තොරතුරු (www.natlib.lk) වෙබ් අඩවිය මගින් ලබා ගත හැක.